# පාරිභෝගික මිල දර්ශකයේ පාද වර්ෂය යාවත්කාලීන කිරීමට අනුමැතිය

කැබිනට් තීරණ

නුවන් කොඩිකාර

ශ්‍රී ලංකාවේ ජාතික පාරිභෝගික මිල දර්ශකයේ පාද වර්ෂය යාවත්කාලීන කිරීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ පියවර ක්‍රියාත්මක කිරීමට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමැතිවරයා ලෙස ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් ඉදිරිපත් කළ යෝජනාවට ඇමැති මණ්ඩලයේ අනුමැතිය හිමිව තිබේ.

පාද වර්ෂය 2013=100 වූ ජාතික පාරිභෝගික මිල දර්ශකය පාද වර්ෂය 2021=100 ලෙස යාවත්කාලීන කිරීම, 2023 ජනවාරි මාසයේ සිට දින 21ක කාලපරාසයක් සහිතව නව ජාතික පාරිභෝගික මිල දර්ශකය සහ ජාතික මට්ටමේ උද්ධමන අනුපාතිකය මාසිකව සම්පාදනය කර ප්‍රකාශයට පත් කිරීම, යාවත්කාලීන කරන ලද ජාතික පාරිභෝගික මිල දර්ශකය සඳහා 2019 වර්ෂයේ පාරිභෝගික වියදම් පදනම් කරගෙන බර තැබීම් සිදු කිරීම සහ 2023 ජනවාරි මාසයේ සිට කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශ ආවරණය කරනු ලබන කොළඹ පාරිභෝගික මිල දර්ශකය 2021=100 වන නව පාද වර්ෂය සඳහා යාවත්කාලීන කර කොළඹ දිස්ත්‍රික් නාගරික ප්‍රදේශ සඳහා උද්ධමන අනුපාතිකය සකස් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීමට අනුමැතිය හිමිව තිබේ.



ශ්‍රී ලංකා-මාලදිවයින්